**ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යකරණය) - 2023**

----------------------------------------------------------------------------------------------------------------

ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (අතිරේක මූල්‍යකරණය) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර එළඹි 2021 සැප්තැම්බර් 04 දිනැති අංක 9255 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 2 වන උපලේඛනයේ I (බී) වගන්තිය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 07 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ කාලසීමාව**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන අමාත්‍යාංශය සහ වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තෝරාගත් දිස්ත්‍රික්කවල නල ජල සේවා සහ වැඩිදියුණු කළ සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩිකිරීම, ඒ ආශ්‍රිත ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම සහ සුදුසුකම් ලත් අර්බුදකාරී අවස්ථාවකදී එයට කඩිනමින් හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. අතිරේක මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,823 කට සමාන එ.ජ.ඩො මිලියන 42.74 ක් වූ අතර ඉන් රු.මිලියන 12,000 කට සමාන එ.ජ.ඩො මිලියන 40 ක් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව (අයිබීආර්ඩී) විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය.
අතිරේක මූල්‍ය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය 2021 සැප්තැම්බර් 04 දින එහි කටයුතු ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතිය 2025 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනයේදී මා හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2 වන පරිච්ඡේදයේ 2.3 වගන්තිය. | ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රතික (Septage) පවිත්‍රාගාරයේ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයෙන් ප්‍රසම්පාදන කමිටුවක් පත් කරන ලෙස කළ ඉල්ලීමට පෙර ප්‍රසම්පාදන ආයතනය සමාජ බලපෑම් තක්සේරුව, පාරිසරික බලපෑම් තක්සේරුව වැනි ශක්‍යතා අධ්‍යයනයන් තහවුරු කර නොතිබුණි. කෙසේ වෙතත්, මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය නොලැබීම සහ මහජනතාවගෙන් ලද විරෝධතා නිසා පවිත්‍රාගාරයේ ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි. කෙසේ වෙතත්, අත්හැර දැමූ දිනය දක්වා කළ වැඩ සඳහා කොන්ත්‍රාත්කරු රු. මිලියන 40.2 ක් ඉල්ලා තිබුණි. එබැවින්, ව්‍යාපෘතිය සඳහා දරන ලද පිරිවැය අනාර්ථික වේ. | 40.2 | කෙටුම්පත් පරිසර ඇගයීම් වාර්තා සකස් කර ඇති අතර අවසාන වාර්තාව වැඩිදියුණු කිරීම සඳහා ලෝක බැංකුව සිය අදහස් දක්වා ඇත. මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉල්ලා ඇති පරිදි අනුමැතිය ලබා ගැනීම සඳහා වන සියලුම ලියකියවිලි සහ පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත. තවද, ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් යෝජිත ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දී ඇත. ඉන් අනතුරුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් රන්පොකුණගම නිවාස යෝජනා ක්‍රමයේ අපද්‍රව්‍ය බැහැර කරන ප්‍රදේශය තුළ අක්කර 02 ක ඉඩමක් වෙන් කර දී ඇත. | ප්‍රසම්පාදනය ආරම්භ කිරීමට පෙර මාර්ගෝපදේශයට අනුව සියලුම නිෂ්කාශන තහවුරු කර ගත යුතු අතර ව්‍යාපෘති අරමුදල් අනාර්ථික ලෙස භාවිත වන පරිදි නොසැලකිලිමත් ලෙස කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |

## 3. භෞතික සහ මූල්‍ය කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| කොන්ත්‍රාත්කරු විසින් අතුරු ගෙවීම් සහතික සහ විචලන නියෝග ඉදිරිපත් කිරීම සහ ඒවා අනුමත කිරීම ප්‍රමාද වීම හේතුවෙන් රු. මිලියන 2,830 ක් වටිනා ව්‍යාපෘති 12 ක මූල්‍ය ප්‍රගතිය භෞතික ප්‍රගතියට වඩා අඩු විය. | 2,830.37 | නිරීක්ෂණය සමඟ එකඟ වේ. කෙසේ වෙතත්, සියයට 20 ක අත්තිකාරම් ගෙවීම මූල්‍ය ප්‍රගතියට ඇතුළත් කර නොමැත. එබැවින්, සියයට 20 ක අත්තිකාරම් ගෙවීම මූල්‍ය ප්‍රගතියට ඇතුළත් කළ යුතුය. | ගෙවීම සඳහා අනුමැතිය ලබා දී අත්තිකාරම්වල අදාළ කොටස අඩු කරන තුරු අත්තිකාරම් වියදම් ලෙස ගත නොහැක. එබැවින්, සහතික කළ වැඩ සඳහා ගෙවීමේ ක්‍රියාවලිය දියුණු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති 23 ක් සම්බන්ධයෙන්, ව්‍යාපෘති කාලසීමාව නිසි ලෙස සැලසුම් නොකිරීම හේතුවෙන් දින 17 සිට දින 244 දක්වා සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | අයහපත් කාලගුණික තත්ත්වය, අධික වර්ෂාපතනයෙන් වැඩ බිම් ජලයෙන් යට වීම ප්‍රමාදයට හේතු විය. අස්වනු නෙළීම අවසන් වන තුරු කුඹුරු ප්‍රදේශයේ නල එලීමේ කටයුතු නතර කිරීමට සිදු වේ. වසරේ මාස 2-3 ක් හැර සාමාන්‍යයෙන් සමහර ප්‍රදේශ ජලයෙන් යටවේ. | පරිසරය සහ අනෙකුත් බලපෑම් තක්සේරු කිරීමෙන් පසු ව්‍යාපෘති කටයුතු සැලසුම් කළ යුතුය. එබැවින්, මෙම ව්‍යාපෘතියේ අසාමාන්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා වැඩ කටයුතු අධීක්ෂණය නොකිරීමේ වගකීම කළමනාකරණයට පැවරේ. |
| (ආ) | මූලික අපේක්ෂිත නිම කිරීමේ දිනය 2023 දෙසැම්බර් 31 දින වුවත් කොනාවිල් ජල සම්පාදන ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සහ මූල්‍ය ප්‍රගතිය 2024 මාර්තු 31 වන විට පිළිවෙළින් සියයට 47 ක් සහ සියයට 25.94 ක් විය. භෞතික සත්‍යාපනය සිදු කරන ලද 2023 ඔක්තෝබර් 05 වැනි දිනට මිලිමීටර් 110 පීවීසී පයිප්ප නොමැති වීම හේතුවෙන් සැලසුම් කර තිබූ කිලෝමීටර් 69 න් කිලෝමීටර් 12.23 ක් පමණක් නිම කර තිබුණි. එබැවින්, රු. මිලියන 164.4 ක් වැය කර ඇතත් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය සැලසුම් කළ පරිදි ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | අයහපත් කාලගුණික තත්ත්වය සහ අස්වනු නෙළීම අවසන් වනතුරු කුඹුරු ප්‍රදේශයේ නළ එලීමේ කටයුතු නතර කිරීමට සිදුවීම නිසා ප්‍රමාද වීම. | අනවශ්‍ය ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘතිය සඳහා නියමිත වේලාවට ද්‍රව්‍ය ලබා ගත හැකි බවට කළමනාකාරිත්වය සහතික විය යුතුය. |
| (ඇ) | පරිසර අධිකාරිය විසින් ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දී තිබියදීත් රු. මිලියන 180 ක ඇස්තමේන්තුගත වියදමින් ඉදිකිරීමට සැලසුම් කර තිබූ මාතර දිස්ත්‍රික්කයේ කොටවිල පිහිටි ප්‍රතීක පවිත්‍රාගාරය සඳහා ප්‍රසම්පාදන කටයුතු 2024 මැයි 31 දින දක්වා සිදු කර නොතිබුණි. තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2022 සැප්තැම්බර් 01 වන දින පවිත්‍රාගාරය සඳහා මාතර නගර සභාව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. | අතිරේක මූල්‍යකරණයේ සීමා කිරීම් හේතුවෙන්, කොටවිල ප්‍රතීක පවිත්‍රාගාරයේ ඉදිකිරීම් කටයුතු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යා නොහැක. | වැඩවල අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලබා ගැනීමේ හැකියාව ආරම්භයේදීම සහතික කළ යුතුය. |